**ගලේවෙල ප්‍රාදේශීය සභාව.**

**--------------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**-------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 28 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ගලේවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම්වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට අදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායක වීමේ ගිණුමේ ශේෂවල එකතුව අතර වසර 14 කට පෙර සිට පවතින රු.1,166,909 ක වෙනස සමාලෝචිත වර්ෂය තුළ ද දක්නට ලැබිණි.

(ආ) සභාව සතු සුසාන භූමි 82 කට අයත් අක්කර 116 යි රූඩ් 03 යි පර්චස් 17 ක ඉඩම් ප්‍රමාණය තක්සේරු කොට ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියන් වශයෙන් දැක්විය යුතු එකතුව රු.1,235,000 ක ශේෂ 02 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමියන් වශයෙන් දැක්විය යුතු රු.1,388,160 ක ශේෂ 02 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති දෙකක් සඳහා අත්තිකාරම් වශයෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද රු.252,840 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ සභාවේ ගොඩනැගිලි සංවර්ධන කටයුතු සඳහා අවස්ථා හතරකදී දරන ලද රු.6,309,885 ක වටිනාකමක් ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා ඉදිරි වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු රු.21,735,450 ක ණය පොලී මුදල ජංගම වගකීම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.297,735,088 ක් වූ ගිණුම් විෂයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.105,067,875 ක අසමානතාවයන් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

ලැබිය යුතු ගිණුම්

--------------------

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.18,163,524 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

--------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු345,045,896 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 24 වගන්තිය | 2004 වර්ෂයට පසුව අලුතින් ඉදිකර ඇති මාර්ග ගැසට් කර නොතිබුණි. |
| (ii) 123 වගන්තිය | සභාව සතු වාහන කුලියට දීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සම්මත කරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 හා 571 | වසර 02 ක් ඉක්ම වූ රු. 1,423,173 ක් වටිනා පොදු තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක EST-6 / TRORT / 05/3515 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 14 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඈ) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 2013 අප්‍රේල් 11 දිනැති සීපීසී/සීඑස්/06/06/02 චක්‍රලේඛය 04 වගන්තිය | තාක්ෂණ සහයක, වැඩ අධිකාරී, රියදුරන් 04 දෙනෙකු, ගබඩා භාරකරු, ගබඩා භාර ලිපිකරු, හා සරප් තනතුරු දරන නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,022,288 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,739,367 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,003,000 | 2,069,579 | 2,042,291 | 1,739,791 | 1,955,000 | 2,037,404 | 1,666,926 | 1,712,453 |
| කුලී | 4,978,000 | 4,896,885 | 4,731,327 | 815,929 | 4,445,146 | 5,683,627 | 5,256,741 | 650,371 |
| බලපත්‍ර ගාස්තු | 3,000,000 | 2,861,100 | 2,861,100 | 691,370 | 2,600,000 | 2,697,250 | 2,697,250 | 691,370 |
| වෙනත් ආදායම් | 19,850,000 | 18,684,473 | 4,816,042 | 14,425,506 | 19,300,000 | 25,923,993 | 6,961,526 | 19,069,192 |
| | 29,831,000 | 28,512,037 | 14,450,760 | 17,672,596 | 28,300,146 | 36,342,274 | 16,582,443 | 22,123,386 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වත්කම් බදු දීමේදී වර්ෂ 05 කට වරක් බදුකුලිය සංශෝධනය කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අයකර ගැනීම දුර්වල මට්ටමක පැවති අතර, වැඩි වටිනාකමකින් යුතු වරිපනම් ඒකකවලින් හිඟ ශේෂ අයවී නොතිබුණි.

2.2.3 වරිපනම් හා බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.1,650,829 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ බිල් කළ වරිපනම් රු.1,903,676 ක් විය. එයින් 2017 වර්ෂයට අදාළව ලැබී තිබුණේ සියයට 57 ක් වන රු.1,095,211 ක් පමණි.

(ආ) 2011 වර්ෂයේ සිට 2017 වර්ෂයේ නොවැම්බර් දක්වා අනුමත කර තිබූ 475 ක් වූ ගොඩනැගිලි අයදුම්පත්‍ර මත ඉදිකළ ගොඩනැගිලි තක්සේරු කර නොතිබීම හේතුවෙන් ලැබිය යුතු වරිපනම් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි රාජ්‍ය ආයතනවලින් හිග වරිපනම් ලෙස රු.129,830 ක් අයවිය යුතුව තිබුණි.

2.2.4 කුලී

-----

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.68,066 ක හිඟ අක්කර බදු ශේෂය හා 2017 වර්ෂයේ බිල්කළ රු.14,368 ත් සමඟ රු.82,434 ක් වූ මුළු අක්කර බදු වටිනාකමින් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණේ රු.356 ක් වන සියයට 0.43 ක ප්‍රතිශතයක් පමණි.

(ආ) වසර 01 – 06 අතර කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.528,883 ක හිඟහිටි මස් කඩ කුලී ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 බලපත්‍ර ගාස්තු

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර 05 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.691,370 ක හිඟහිටි වෙළඳ බලපත්‍ර ගාස්තු ශේෂය අයකරගෙන නොතිබුණි.

(ආ) සමීක්ෂණයක් මගින් වෙළඳ බලපත්‍ර ගාස්තු අය කළ යුතු ස්ථාන හඳුනා නොගෙන ලැබෙන සම්පූර්ණ ආදායම බිල් කළ ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ පවතින සන්නිවේදන කුලුනුවලින් වාර්ෂික බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

2.2.6 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ජල ගාස්තු

------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.557,075 ක් වූ අතර එම ශේෂය තුළ වසරකට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබූ රු.556,020 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ) විනෝද බදු

-------------

වසර 10 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.6,946 ක හිඟහිටි විනෝද බදු ශේෂය අයකරගෙන නොතිබුණි.

(ඇ) ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන ගාස්තු

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන 09 කට අදාළ ත්‍රීවීල් රථ 159 කින් රු.55,650 ක් අයකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවයේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

ප්‍රාදේශීය සභාව සතු මහජන ක්‍රීඩාංගණ මායිම තුළ සභාව සතු වාහන නවතා තැබීම සඳහා ගරාජයක් සහ වාහන සේදුම් ස්ථානයක් ඉදිකිරීමට ගලේවෙල ගැමි සවිය ප්‍රජා මණ්ඩලය සමඟ රු.600,000 ක මුදලකට ගිවිසුම්ගත වී තිබුණු අතර මෙම ඉදිකිරීම් වැව් රක්ෂිත ප්‍රදේශයට අයත් බව දඹුල්ල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් දන්වා තිබුණු බැවින් අත්තිවාරම් දැමීමෙන් පසුව ගොඩනැගිල්ල ඉදිකිරීම නවතා තිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන කසළ මෙට්‍රික් ටොන් 05 කට ආසන්න ප්‍රමාණයක් ගලේවෙල දොරකැටිවල ප්‍රදේශයේ ඉඩමකට බැහැර කරමින් තිබුණු අතර කසළ බැහැර කිරීම සඳහා අඩි 100 x 16 ප්‍රමාණයේ ආවරණය සහිත කානු දෙකක් හා කසළ තේරීම සඳහා අඩි 60 x 40 ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එහෙත් කානු 02 තුළ දිරාපත් වූ කසළවලින් ඉවත් කරන ලද කොම්පෝස්ට්වල පොලිතීන් අපද්‍රව්‍ය විශාල වශයෙන් මිශ්‍රව පවතින බව ක්ෂේත්‍ර පරීක්ෂණයේදී දක්නට ලැබුණි.

ii. එකතු කරනු ලබන කසළ සම්පූර්ණයෙන්ම නොතෝරා පොලිතීන් අපද්‍රව්‍ය සමඟ කානු තුළට යොමු කිරීම හේතුවෙන් හා කානු තුළ පවතින තෙත් ස්වාභාවය හේතුවෙන් කසළ දිරාපත් වීම නිසි පරිදි සිදුව නොතිබුණි.

iii. අංක 02 කසළ කාණුව ක්ෂේත්‍රයේ පහළ ස්ථානයක ඉදිකර තිබීම නිසා වැසි ජලය මෙම ස්ථානය හරහා ගමන් කිරීම හේතුවෙන් එම ස්ථානය භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි.

iv. කසළ වර්ගීකරණ ක්‍රියාවලිය විධිමත් කොට කාණු සඳහා දිරාපත් වන කසළ පමණක් යොමු කිරීමට හා ගුණාත්මක තත්ත්වයෙන් යුතු කොම්පෝස්ට් නිපදවීම කෙරෙහි හා පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි.

v. යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ මාර්ග පථයට අයත් වන ස්ථානයක කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය පිහිටා ඇති බව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දන්වා තිබුණු අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා

සුදුසු ඉඩමක් ලබාගැනීම හා අදාළ වැඩසටහන පවත්වාගෙන යන ආකාරය පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වෙළඳ සංකීර්ණ 06 ක බදුකුලි සංශෝධනය හා බදු ගිවිසුම් අලුත් කිරීම වසර 15 ක සිට සිදුකර නොතිබුණි.

(ආ) බිම් සවිය කාර්යාලය සඳහා සභාව සතු ගොඩනැගිල්ලක් තක්සේරු කිරීමකින් තොරව 2013 අප්‍රේල් 24 දින සිට රු.25,000 ක මාසික කුලියක් මත බදු දී තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.200,000 ක කුලියක් අයකර ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සභාව සතු වාහන 02 ක් සඳහා ආදායම් බලපත්‍ර ද එක් වාහනයක් සඳහා රක්ෂණ සහතිකය ද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) කොන්ත්‍රාත් සඳහා ගිවිසුම්වලට එළඹීමේදී නියමිත දිනයට වැඩ අවසන් නොකරන ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සඳහා වූ ප්‍රතිපාදන කොන්ත්‍රාත් ගිවිසුම් තුළ අන්තර්ගත නොකිරීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) විවිධ ආදායම් විෂයන් සඳහා ආදායම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 21 ක් පැවති අතර මෙම පුරප්පාඩුවලින් 16 ක්ම ද්විතීක මට්ටමේ කාර්ය මණ්ඩලය විය.

(ආ) ප්‍රාදේශීය සභාවේ ඇතැම් නිලධාරීන් වර්ෂ 05 කට වැඩි කාලයක් ස්ථාන මාරු නොලබා එකම සේවා ස්ථානයේ සේවය කරමින් තිබුණි.

(ඇ) සේවකයින් 07 දෙනෙකුගෙන් වසර ගණනාවක සිට අයවිය යුතුව තිබූ එකතුව රු.88,000 ක සේවක ණය සමාලෝචිත වර්ෂයේදී ද අයකර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 33 කින් 26 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණු නමුත් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ අයදුම්පත් 05 ක් සඳහා පමණි.

3.5 මතභේදයට තුඩුදුන් ගනුදෙනු
---------------------------------
කඳුරට සංවර්ධන බැංකුව සඳහා ගොඩනැගිල්ලක් කුලියට ලබාදීම
------------------------------------------------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) හා (xi) වගන්තිය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභාවට අයත් තොග පොළ භූමියේ ඇති ගොඩනැගිල්ලක් කඳුරට සංවර්ධන බැංකුවට මාසිකව රු.38,000 ක මුදලකට 2008 වර්ෂයේ

සිට 2036 වර්ෂය දක්වා බදු දී තිබුණි. බැංකුව විසින් කරන ලද ඉදිකිරීම් වෙනුවෙන් කුලී මුදල් හිලව් කරගත යුතු බවට ගිවිසුමේ දක්වා තිබුණ ද බැංකුව විසින් කළ ඉදිකිරීම් සඳහා දරන ලද පිරිවැය සම්බන්ධයෙන් එකඟතාවයක් බැංකුව සමඟ ඇති කරගෙන නොතිබුණි.

(ආ) යථෝක්ත ගොඩනැගිල්ල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් 08 දිනැති අංක ME/RP/961 දරන ලිපිය මගින් දන්වා තිබූ මාසික තක්සේරු කුලිය රු.70,000 ක් වුවත් මාසික බදුකුලිය සංශෝධනය කිරීම පිළිබඳ ප්‍රතිපාදන බදු ගිවිසුමේ ඇතුළත් නොකිරීම හේතුවෙන් අදාළ තක්සේරු කුලිය ගෙවීමට කඳුරට සංවර්ධන බැංකුව එකඟ වී නොතිබුණි.

(ඇ) කුලී සංශෝධනයට අදාළව වගන්ති ගිවිසුම තුළ ඇතුළත් නොවීම සභාවට අවාසි සහගත තත්ත්වයක් වූ අතර මේ හේතුවෙන් 2036 වර්ෂය දක්වා රු.70,000 ක තක්සේරු කුලිය මත සභාවට සිදුවන ගණනය කළ හැකි අලාභය රු.12,801,000 ක් විය.

3.6. වත්කම් කළමනාකරණය

----------------------------

3.6.1 පවරා නොගත් වත්කම්

--------------------------

ප්‍රාදේශීය සභාව සතු වාහන දෙකක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු රු.3,000,000 ක් වටිනා ගලිබවුසරය හා රු.79,000 ක් වටිනා කුබෝටා අත්ට්‍රැක්ටරය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ආ) සභාව සතු වෑන් රථයක් 2017 අප්‍රේල් මාසයෙන් පසු ධාවනයෙන් ඉවත් කර තිබූ අතර අලුත්වැඩියා හා නඩත්තු කටයුතු වෙනුවෙන් රු.101,751 ක් සමාලෝචිත වර්ෂය තුළ වැයකර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ අලුතින් ගරාජයක් ඉදිකිරීම සඳහා 2015 වර්ෂයේ මිලට ගන්නා ලද රු.199,095 ක් වටිනා භාණ්ඩ භාවිතයට නොගෙන ගබඩාවේ ගොඩගසා තිබුණි.

3.7 අවිධිමත් ගනුදෙනු

---------------------

ප්‍රාදේශීය සභාවට අයත් ගලේවෙල වෙළඳ සංකීර්ණයේ නව ගොඩනැගිල්ලෙහි 15 කඩ කාමරය 2007 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව රු.6,750 ක් වුවත්, 2013 සැප්තැම්බර් 30 දිනැති සභා තීරණයක් මත මාසික කුලිය රු.3,500 ක් බැගින් වන සේ 2013 දෙසැම්බර් 02 දින සිට ගිවිසුම්වලට එළඹ තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස වන විට සභාවට රු.159,250 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි.

3.8 හඳුනාගත් පාඩු

------------------

වාහන 09 ක් සඳහා ආදායම් බලපත්‍ර නියමිත කාලය තුළ ලබා නොගැනීම හේතුවෙන් රු.9,175 ක දඩ මුදල් ගෙවා තිබුණි.

3.9 ද්‍රව්‍ය අක්‍රමිකතා

-------------------

සභාවට අයත් පුස්තකාල 06 හි 2012 වර්ෂයේ සිට මිලදී ගත් පුවත්පත් භාවිතයෙන් පසුව පැරණි පුවත්පත් විකිණීමෙන් ලද රු.62,951 ක මුදලක් සභා අරමුදලට බැර නොකර අගරු චෙක්පත් විවිධ භාණ්ඩ ඌනතා සහ පැරණි හිඟණය ශේෂ පියවීම වෙනුවෙන් යොදාගෙන තිබුණු බව අනාවරණය විය.

3.10 ප්‍රසම්පාදනය

---------------

3.10.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකර 2017 වර්ෂය තුළ රු.440,293 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

3.10.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගාසිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන - 2016 යටතේ රු.2,153,547 ක වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට පවරා වැඩ නිමකර තිබූ මකුළුගස්වැව පොළ ගොඩනැගිල්ල අලුත්වැඩියාව සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

i. වැඩ විෂය අංක 12 යටතේ බිම කොන්ක්‍රීට් දැමීම සඳහා වර්ග මීටර් 161 ක් වෙනුවෙන් රු.136,836 ක් ගෙවා තිබූ නමුත් කොන්ක්‍රීට් ඇතිරූ භූමිය බොල් ගතියෙන් යුක්ත විය.

ii. පහත සඳහන් වැඩ විෂයයන් වෙනුවෙන් වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි.

| වැඩ විෂය අංකය | විස්තරය | ගෙවිය යුතු මුදල | ගෙවූ මුදල | වැඩිපුර ගෙවීම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 14 | වහලය ඉදිකිරීම | 562,328 | 594,663 | 32,335 |
| 15 | ඇස්බැස්ටෝස් සවි කිරීම | 54,054 | 60,329 | 6,275 |
| 13 | තලාද හා ගේබල් සඳහා කෝණික යකඩ සවි කිරීම | 234,773 | 240,318 | 5,545 |
| 16 | වඩිම්බු ලැලි සවි කිරීම | 133,673 | 135,218 | 1,545 |

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විශේෂ ප්‍රතිපාදන වැඩසටහන - 2014 යටතේ රු.980,000 ක මුදලකට සිංහ ප්‍රජා මණ්ඩලයට පවරා 2016 දෙසැම්බර් 09 දින වැඩ අවසන් කර තිබූ දිවුල්ගස්කොටුව දිවාරාත්‍රි වොලිබෝල් ක්‍රීඩාංගණය ඉදිකිරීම සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී භෞතිකව පරීක්ෂා කිරීමේදී, ක්‍රීඩාංගණයේ ආවරණ දැල විනාශ වී ඇති බව, සවිකර තිබූ GI බටවල නිසි පරිදි තීන්ත ආලේප නොකිරීම, වතුර ඇතුල්වීම වැළැක්වීම සඳහා End Cap සවිකර නොතිබීම හා වර්තමානයේ දී ක්‍රීඩාංගණය භාවිතා නොකරන බව නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයන් 06 කට අදාළව රු.507,000 ක ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් අයකරගෙන නොතිබුණි.

(ආ) ආදායම් විෂයන් 54 ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර අහිතකර විචලනය සියයට 05 සිට සියයට 200 අතර පරාසයක පැවතුණි.

(ඇ) වැය විෂයන් 52 ක් සඳහා ඇති කළ රු.4,231,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
------------------------

සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කිරීම වෙනුවෙන් නිලධාරියෙකු පත්කර තිබූ නමුත් ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදුවී නොමැති අතර අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු
-------------------------------------

මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 අගෝස්තු 01 දිනැති සීපීසී/සීඑම්එස්/01/06 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත් විය යුතු වුවත් 2017 වර්ෂය තුළ පවත්වා තිබුණේ කමිටු වාර 02 ක් පමණක් වූ අතර 2016 වර්ෂයේ කමිටු වාර 01 ක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලනය
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) වත්කම් පාලනය | i. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම.<br>ii. වත්කම් ආරක්ෂාව හා නඩත්තුව සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ආ) වාහන පාලනය | i. වාහන ධාවන සටහන් යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම.<br>ii. වාහනවල ඉන්ධන දහනය පරික්ෂා කිරීමට කටයුතු නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| | | iii. | ධාවනයෙන් ඉවත් කළ වාහන සඳහා සුදුසු ක්‍රියාමාර්ග නොගැනීම. |
| | | iv. | සමහර වාහනවල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ණයගැති හා ණයහිමි පාලනය | | දීර්ඝ කාලීනව පවතින ණයගැති ශේෂ සොයාබලා නිරවුල් කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | | තෘතීයික හා ද්විතියික ශ්‍රේණිවල කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | ආදායම් කළමනාකරණය | i. | ආදායම් රැස්කිරීමේ දුර්වල ප්‍රගතිය හේතුවෙන් හිඟ ආදායම් ප්‍රමාණය ඉතා විශාල වශයෙන් ඉහළයාම. |
| | | ii. | ආදායම් රැස්කිරීමට අදාළව නිසි ආදායම් ලේඛන පවත්වා නොගැනීම. |
| | | iii. | දේපළ කාලීනව තක්සේරු කර ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීමට කටයුතු නොකිරීම. |